# ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය

## ශ්‍රී ලංකා සංචාරක ව්‍යාපාරයේ ප්‍රමුඛ ආයතනය සමග ඔබේ හැකියාවන් බෙදාගන්න

ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය යනු සංචාරක ව්‍යාපාරය සහ ඒ ආශ්‍රිත කර්මාන්ත සැලසුම් කිරීම, සංවර්ධනය කිරීම, නියාමනය කිරීම සහ ප්‍රතිපත්ති ක්‍රියාවට නැංවීම සඳහා පැවරී ඇති රජයේ අධිකාරිය වේ. සංචාරක ක්ෂේත්‍රයේ අනාගතය සඳහා ජාතික ආර්ථිකයට තීරණාත්මක දායකත්වයක් සපයන්නෙකු ලෙස හඳුනාගෙන ඇත. මෙම අංශය ඉහළම සෘජු විදේශ ආයෝජන සහ ඉහළ මට්ටමේ ආයෝජක ව්‍යාපෘති කිහිපයක් ද රට වෙත ආකර්ෂණය කරයි.

අධිකාරියේ පවතින පහත දැක්වෙන පුරප්පාඩු සඳහා සුදුසුකම්ලත් අය වෙතින් අයදුම්පත් කැඳවනු ලැබේ.

| අංකය | තනතුර | සේවා කාණ්ඩය | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|
| 01. | සහකාර අධ්‍යක්ෂ / සංචාරක සංවර්ධන | MM 1-2 | 04 |
| 02. | සහකාර අධ්‍යක්ෂ / නීති | MM 1-2 | 01 |
| 03. | සහකාර අධ්‍යක්ෂ / මූල්‍ය කළමනාකරණය | MM 1-2 | 02 |
| 04. | කනිෂ්ඨ කළමනාකරු / සංචාරක සංවර්ධන | JM 1-2 | 02 |
| 05. | කනිෂ්ඨ කළමනාකරු / වෙබ් ප්‍රසන්ස් (Web Presence) | JM 1-2 | 01 |
| 06. | විමර්ශන නිලධාරී | MA 5-2 | 02 |
| 07. | කළමනාකරණ සහකාර | MA 1-2 | 10 |

**උනන්දුවක් දක්වන අයදුම්කරුවන් පහත මාර්ගෝපදේශ පිළිපැදිය යුතුය :**

- අවශ්‍ය සුදුසුකම් ඇතුළත් විස්තරාත්මක රැකියා දැන්වීම SLTDA වෙබ් අඩවියේ "Careers" ප්‍රවේශය යටතේ ලබාගත හැක – **http://www.sltda.gov.lk/en/careers.**
- තනතුරට අදාළ අයදුම්පත්‍රය ඉහත වෙබ් පිටුවෙන් බාගත කර අපේක්ෂා කරන තනතුරට අදාළව පුරවා සම්පූර්ණ කළ යුතුය.
- සියලුම අයදුම්කරුවන් ශ්‍රී ලංකා පුරවැසියන් විය යුතුය.
- තනතුරෙහි කාර්යයන් කාර්යක්ෂම ලෙස ඉටු කිරීමට හොඳ ශාරීරික හා මානසික මට්ටමක සිටිය යුතු අතර, රටේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට බැඳී සිටිය යුතුය.
- සම්පූර්ණ කරන ලද අයදුම්පත අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් සහ සේවා පළපුරුද්දට අදාළ සහතික කළ පිටපත් හා ඥාතීන් නොවන නිර්දේශකයින් දෙදෙනෙකුගේ ඇමතුම් තොරතුරු සමග 2026 ජනවාරි 22 වන දින හෝ ඊට පෙර සභාපති, ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය, නො: 80, ගාලු පාර, කොළඹ 03 ලිපිනය වෙත ලියාපදිංචි තැපැල මගින් එවිය යුතුය. අයදුම්පත බහාලන කවරයේ ඉහළ වම් කෙළවරේ අයදුම්කරනු ලබන තනතුර සඳහන් කළ යුතුය.
- රජයේ දෙපාර්තමේන්තු, රාජ්‍ය සංස්ථා හෝ ව්‍යවස්ථාපිත මණ්ඩලවල දැනට සේවය කරන අයඳුම්කරුවන් තම අයදුම්පත අදාළ දෙපාර්තමේන්තු ප්‍රධානීන් හරහා ඉදිරිපත් කළ යුතුය.

ඉහත අවශ්‍යතා සපුරා නොමැති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. අවම සුදුසුකම් සපුරා ඇති අපේක්ෂකයින් කෙටි ලැයිස්තුගත කිරීමේ අයිතිය අධිකාරී කළමනාකාරිත්වය සතුය. ඕනෑම ආකාරයකින් බලපෑම් කිරීම නුසුදුසුකමක් ලෙස සලකනු ලැබේ.

**සේවක අර්ථසාධක අරමුදල සහ සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදලට දායකත්වය**

තෝරාපත්වන අයදුම්කරුවන් තම වැටුපෙන් 10%ක් සේවක අර්ථසාධක අරමුදලට (EPF) දායක විය යුතුය. අධිකාරිය විසින් සේවක අර්ථසාධක අරමුදලට (EPF) 15% ක් සහ සේවක භාරකාර අරමුදලට (ETF) 3%ක් දායක වනු ඇත.

**වැටුප**

2025 අප්‍රේල් 01 සිට ක්‍රියාත්මක වන කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු චක්‍රලේඛ 01/2025 අනුව වැටුප් ගෙවනු ලැබේ.

පුරප්පාඩු පිරවීම හා බඳවාගැනීම් සම්බන්ධයෙන් අධිකාරිය විසින් ගනු ලබන තීරණ අවසන් තීරණය වේ.

**සභාපති,**
**ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය,**
**අංක 80, ගාලු පාර, කොළඹ 03.**

**ප්‍රකාශිත දිනය 08.01.2026**